Article 12 (1)
12 (11)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. }
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2019-02-08

පැමිණිලි පාර්ශවය :- ඒ.එච්.එම් රංජිත් සිසිර කුමාර මයා.
2/63/ඒ. පරගහකැලේ.
අම්පාර.

වගඋත්තර පාර්ශවය :- 01. ලේකම්,
පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය.
ත්‍රිකුණාමලය.

02. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ.
කලාප අධ්‍යාපන කාර්යාලය.
අම්පාර.

**පැමිණිලි අංකය :- HRC/AM/150/15/S/ EM, HRC/AM/72/16/T/EM**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තමා 2007.09.27 සිට 2015.10.05 වනදින දක්වා වසර 08 කට අධික කාලයක් අම්/පොල්වත්ත මහා විද්‍යාලයේ සේවය කළ බවත්. තමාගේ අසනීප තත්වය නිසා අධ්‍යාපන ලේකම්තුමාගේ නිර්දේශ මත වගඋත්තර පාර්ශවීය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් 2015.10.05 වන දින සිට අම්/කාවන්තිස්ස මහ විද්‍යාලයට ස්ථානමාරුවක් ලද බවත්. එහෙත් එම ස්ථාන මාරුවෙන් මාසයක් ගතවන්නට පෙර වාර්ෂික ස්ථානමාරු නමින් වගඋත්තර පාර්ශවීය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ ලිපියෙන් තමා අම්/කොක්නහර මහා විද්‍යාලය වෙත ස්ථාන මාරු කළ බවත්. එමෙන්ම තමන් හදිසි අනතුරු 2කට මුහුණපෑමට සිදුවීමෙන් පසුකාලීනව ස්නායු ආබාධ ඇති වීමට ඉඩ ඇති බැවින් වෛද්‍ය උපදෙස් අනුව දුර ගමන් යාම සුදුසු නොවන බවට දක්වමින් ඉදිරිපත් කළ අභියාචනයද ප්‍රතික්ෂේප කළ බවත්ය. එයට හේතු වශයෙන් දක්වා ඇත්තේ 'දුෂ්කර සේවා නොකිරීම' හා 'පාසලේ පුරප්පාඩු නොමැතිකම' බවත්. අම්/කාවන්තිස්ස විද්‍යාලයේ සේවය සම්පූර්ණ වීමෙන් පසුව ස්ථාන මාරු කළ හැකිව තිබියදීත් මසක පමණ සේවා කාලයෙන් පසුව දුෂ්කර

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 011-2505575 / 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

පාසලක් වන අම්/කොක්නහර විද්‍යාලයට මාරුකිරීම පළිගැනීමේ චේතනාවෙන් සිදුකරන ලද්දක් බවත්. ඒ අනුව එය නීති විරෝධී ස්ථානමාරුවක් බවත් එයින් තමාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවත් එබැවින් එම ස්ථාන මාරුව අවලංගු කරන ලෙසත් පැමිණිල්ල මගින් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ල පිළිබඳව 2016.02.01 වන දින විභාගයක් පවත්වා ඇති අතර. එකී විභාගයේදී වගඋත්තර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සඳහන් කර ඇත්තේ. මාරුවීම් මණ්ඩලය විසින් පැමිණිලිකරු අම්/කාවන්තිස්ස විද්‍යාලයේ සිට අම්/කොක්නහර මහා විද්‍යාලය වෙත ස්ථාන මාරුකළ බවත්. ඒ සඳහා ගුරු සංගම්වලටද මැදිහත්වීමක් තිබූ බවත්ය. එමෙන්ම අම්/කාවන්තිස්ස විදුහලේ ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු නොමැතිවීම ඒ සඳහා හේතුවක් වූ බවත් දක්වා ඇත. කෙසේ නමුත් පැමිණිලිකරුට සහනයක් සැළසීම සඳහා පැමිණිලිකරු අම්/දීඝවාපිය විදුහලට ස්ථානමාරු කිරීමට එකඟව ඉහත දින පැමිණිලි විභාගය අවසන් කරගැනීමට පාර්ශව එකඟ වී ඇත. ඒ අනුව අම්/කාවන්තිස්ස විද්‍යාලයේ පුරප්පාඩු නාමැති වීම හේතුවෙන් අම්/දීඝවාපිය විදුහලට ස්ථානමාරු කරන ලද බවත් වගඋත්තර පාර්ශවය දන්වා ඇත.

පැමිණිලිකරු නැවත වතාවක් 2016.06.05 වන දින කොමිෂන් සභාවට දැනුම්දී ඇත්තේ. අම්/කාවන්තිස්ස මහ විද්‍යාලයේ ඉංග්‍රීසි ගුරු පුරප්පාඩුවක් නොමැති බව පවසා තමන් එම පාසලෙන් ඉවත් කළ නමුත් අම්/කාවන්තිස්ස විද්‍යාලයට වෙනත් ඉංග්‍රීසි ගුරුවරියක් 2016.05.18 වන දින සිට ස්ථාන මාරු කර ඇති බවත් එකී ගුරුවරියට තමන් මීට පෙර ඉගැන්වීම් කළ කාල සටහන් ලබා දී ඇති බවත් ඒ අනුව අම්/කාවන්තිස්ස විද්‍යාලයේ පුරප්පාඩු පවතිද්දී තමන් වෙනත් පාසලකට ස්ථාන මාරු කිරීමෙන් වගඋත්තර පාර්ශවය සැලසුම් සහගතව තමන්ගේ මූලික අයිතිවාසිකම් තවදුරටත් උල්ලංඝනය කර ඇති බවත්ය.

ඒ සම්බන්ධයෙන් වගඋත්තර පාර්ශවය ලිඛිත කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ. අම්/කාවන්තිස්ස මහඃ විද්‍යාලය වෙත ගර්භනීභාවය හේතුවෙන් මානුෂීය පදනම මත තාවකාලික ගුරුවරියක් ස්ථානමාරු කර ඇති බවත් අධ්‍යාපන ලේකම්ගේ දැනුම්දීම මත එය සිදුකර ඇති බවත්ය.

මේ අතර පැමිණලිකරු විසින් 2017.01.19 වන දින නැවත වතාවක් සඳහන් කර ඇත්තේ. තවත් ඉංග්‍රීසි ගුරුවරයෙකු අම්/කාවන්තිස්ස විද්‍යාලයට ස්ථාන මාරු කර ඇති බවයි. ඒ අනුව තවදුරටත් වගඋත්තර පාර්ශවය තමන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් සිටින බවත් පුරප්පාඩු නොමැති බව කියමින් නැවත අම්/කාවන්තිස්ස විද්‍යාලයට ඉංග්‍රීසි ගුරුවරයෙකු ස්ථාන මාරු කරන්නේ සත්‍ය වශයෙන්ම පුරප්පාඩු පවතින නිසා බවත්. මේ ගැන පරීක්ෂාකර බලා මේ සඳහා නිර්දේශයක් ලබාදෙන ලෙසත් ඉල්ලා සිටී.

ඒ සම්බන්ධයෙන්ද වගඋත්තර පාර්ශවීය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, අම්පාර විසින් වාර්තාවක් සපයා ඇති අතර, එහි සඳහන් වන්නේ 10 හා 03 ශ්‍රේණියේ එක සමාන්තර පන්තිය බැගින් වැඩිවීම නිසා ඉංග්‍රීසි විෂය කාල සටහනට කාලච්ඡේද කිහිපයක් වැඩිවී ඇති බවත්, එමෙන්ම 2017 ඉංග්‍රීසි ඩිප්ලෝමාධාරී ගුරුවරුන් 20ක් කලාපයට පත්වීම් ලැබූ බවත්, ඒ අනුව එහි හිටපු ඉංග්‍රීසි ගුරුවරයා අතිරික්ත ලෙස හඳුනාගෙන ඒ අනුව එම ගුරුවරයා අම්/කාවන්තිස්ස විද්‍යාලයට ස්ථාන මාරු කළ බවත්ය.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු හා නිරීක්ෂණ :-**

පැමිණිලිකරු 2007 වසරේ සිට 2015 දක්වා අම්/පොල්වත්ත මහ විද්‍යාලයේ සේවය කර ඇති අතර, ඔහුගේ අසනීප තත්වය අනුව නැගෙනහිර පළාත් අධ්‍යාපන ලේකම්ගේ 2015.09.09 වන දින දැනුම්දීම මත වගඋත්තර පාර්ශවීය අම්පාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2015.10.05 දිනැතිව අම්/කාවන්තිස්ස විද්‍යාලයට ස්ථානමාරු කර ඇති බව අනාවරණය වේ.

එසේ පැමිණිලිකරු ස්ථානමාරුකර මසක් ගතවන්නට පෙර වගඋත්තර පාර්ශවීය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් වාර්ෂික අභ්‍යන්තර ගුරු ස්ථානමාරු යටතේ අම්/කොක්නහර මහ විද්‍යාලය වෙත ස්ථාන මාරුකර ඇති අතර එයට හේතු වශයෙන් දුෂ්කර සේවා කාලයක් සම්පූර්ණ නොකිරීම හා අම්/කාවන්තිස්ස විද්‍යාලයේ පුරප්පාඩු නොමැති වීම බවට දක්වා ඇත.

පැමිණිලිකරු එකී ස්ථාන මාරුව සම්බන්ධයෙන් අභියාචනයක් 2015.11.04 වන දින ගුරුමාරු මණ්ඩලය වෙත ඉදිරිපත් කරමින් වෛද්‍ය හේතූන් මත ස්ථාන මාරුව අවලංගු කරන ලෙස ඉල්ලා ඇති බව අනාවරණය වේ.

පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය ගුරුමාරු මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කර ඇති අතර ඊට හේතු වශයෙන් අම්/කාවන්තිස්ස මහ විද්‍යාලයේ පුරප්පාඩු නොමැතිවීම හා දුෂ්කර සේවය සම්පූර්ණ නොකිරීම යන හේතූන් නැවතත් සඳහන් කර ඇති බව අනාවරණය වේ.

වගඋත්තර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2016.01.29 දිනැතිව කොමිෂන් සභාවට යොමුකර ඇති වාර්තාවට අනුව හා පරීක්ෂණ වලදී අවධාරණය කර ඇත්තේ, අම්/කාවන්තිස්ස විද්‍යාලයේ ඉංග්‍රීසි ගුරු පුරප්පාඩුවක් නොපවතින අතර ඔහු එම විදුහලට මාරුවීමෙන් අර්බුදයක් නිර්මාණය වූ බවයි. මේ සම්බන්ධව ගුරු සංගම් නියෝජිතයින් සමඟ අධ්‍යාපන ලේකම් විසින් කරන ලද සාකච්ඡාවේදී පුරප්පාඩු සහිත පාසලකට පැමිණිලිකරු ස්ථානමාරු කිරීමකට එකඟ වූ බවද වගඋත්තර පාර්ශවීය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සඳහන් කර ඇත.

එකී කරුණු තහවුරු කිරීම සඳහා 2016.01.19 දිනැතිව අම්පාර දිස්ත්‍රික් අධ්‍යාපන වෘත්තීය සමිති එකමුතුව විසින් කොමිෂන් සභාව වෙත යොමු කර ඇති ලිපියක් ඉදිරිපත් කරනු ලබන අතර එහි

සඳහන් වන්නේ පැමිණිලිකරු අම්/කාවන්තිස්ස මහ විද්‍යාලයට ස්ථානමාරු කිරීම අර්බුධකාරී බවත්. පුරප්පාඩු සහිත පාසලකට ස්ථානගත කිරීමට අධ්‍යාපන ලේකම් එකඟ වූ බවත්ය.

මෙකී කරුණු ඉදිරිපත් කරමින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අම්/කාවන්තිස්ස විද්‍යාලයේ ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු නොමැති බව තහවුරු කර ඇත.

තවදුරටත් ඒ බැව් තහවුරු කිරීම සඳහා 2016.11.01 දිනැති වාර්තාව ඉදිරිපත් කරමින් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද අම්පාර අධ්‍යාපන කලාපයේ අනුමත සේවක සංඛ්‍යාව ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව අම්/කාවන්තිස්ස විද්‍යාලයේ අනුමත ඉංග්‍රීසි ගුරු කාර්ය මණ්ඩල සංඛ්‍යාව 5 ක් බව අනාවරණය කර ඇත.

පාසලක සිටිය යුතු අධ්‍යාපන කාර්ය මණ්ඩලය නිර්ණය කිරීම සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් විසින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ කිහිපයක් වන අතර එකී චක්‍රලේඛ පරිදි අම්/කාවන්තිස්ස විද්‍යාලයේ අනුමත ඉංග්‍රීසි ගුරු කාර්ය මණ්ඩලය 08 ක් බව පැමිණිලි පාර්ශවය අනාවරණය කරයි. පාසලක සිටිය යුතු අධ්‍යාපන කාර්ය මණ්ඩලය නිර්ණය කිරීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛ 12/2015 අනුව ඊට පෙර නිකුත් කර ඇති 2003/38 චක්‍රලේඛය බල රහිත වන බව දක්වා ඇත. ඒ අනුව 12/2015 අනුව පාසලක ශිෂ්‍ය හා පන්ති සංඛ්‍යා පදනම් කරගන්නා බව චක්‍රලේඛයේ දැක්වේ. ඒ අනුව අම්/කාවන්තිස්ස විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව සිටිය යුතු ඉංග්‍රීසි ගුරු සංඛ්‍යාව තීරණය කළ යුතු බව පැමිණිලි පාර්ශවය අනාවරණය කරයි.

නමුත් 01/2016 අධ්‍යාපන අමාත්‍යංශ චක්‍රලේඛනයක් නිකුත් කර ඇති අතර එහි සඳහන් වන්නේ ඊට පෙර නිකුත් කර ඇති 12/2015 චක්‍රලේඛය හා ඊට පෙර ලබා දී තිබූ සියලු විධිවිධාන ඇති 01/2016 චක්‍රලේඛය ක්‍රියාත්මක කළ යුතු බවයි. මෙකී චක්‍රලේඛය අනුව අම්/කාවන්තිස්ස විද්‍යාලයේ පවතින අනුමත ඉංග්‍රීසි ගුරු කාර්ය මණ්ඩලය 08 ක් බව පැමිණිලි පාර්ශවය අනාවරණය කරයි.

නමුත් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ. 12/2015 හා 01/2016 චක්‍රලේඛ පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලය නිර්ණය කිරීම සකස් කර ඇතත්. මෙතෙක් එය අනුමත වී නොමැති බවත් 2003/35 චක්‍රලේඛය පරිදි කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත ගුරු සංඛ්‍යාව තීරණය කර ඇති බවත් ඒ අනුව අම්/කාවන්තිස්ස විද්‍යාලයේ ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු නොමැති බවත්ය.

එමෙන්ම වගඋත්තර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ කරුණු ඉදිරිපත් කිරීමේදී අම්පාර අධ්‍යාපන කලාපයේ ඉංග්‍රීසි ගුරුභවතුන් 120 ක පමණ ඌණතාවයක් පවතින බවත් ඒ අනුව අම්/කාවන්තිස්ස විද්‍යාලයේ පමණක් අනුමත ගුරු සංඛ්‍යාවට අදාළව ගුරුවරුන් සම්පූර්ණයෙන් සැපයීමෙන් අනෙක් පාසල් නොසලකා හැරීමක් සිදුවන බවත්ය.

පැමිණිලිකරු විසින් තමන්ට අම්/කාවන්තිස්ස විද්‍යාලයේ සිට අම්/කොක්නහර මහ විද්‍යාලය වෙත ලබාදුන් ස්ථාන මාරුව සම්බන්ධයෙන් අභියාචනා කිරීමේදී අභියාචනා මණ්ඩලය විසින් ඔහුගේ වෛද්‍යමය හේතූන් සැළකිල්ලට ගෙන නොමැති බව අනාවරණය වේ.

මූලිකව වගඋත්තර පාර්ශවය විසින් අනාවරණය කර ඇත්තේ අම්/කාවන්තිස්ස විද්‍යාලයේ ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු නොමැතිවීම හා ඒ සම්බන්ධව ගුරු සංගම් නියෝජිතයින්ගේ මැදිහත්වීම නිසා පැමිණිලිකරුට අම්/කාවන්තිස්ස විද්‍යාලයට ලබාදුන් ස්ථානමාරුව අවලංගු කළ බවය.

පැමිණිලිකරු විසින් මූලිකවම අනාවරණය කර ඇත්තේ, අධ්‍යාපන ලේකම් විසින් අම්පාර කලාප අධ්‍යාපන නිර්දේශ මත අම්/කාවන්තිස්ස විද්‍යාලයට ලබාදුන් ස්ථානමාරුව එකී පාසලේ පැවැති පුරප්පාඩු හා වෛද්‍ය හේතු සලකා ලබාදුන් එකක් බවත්. එමෙන්ම 12/2015 හා 01/2016 අනුව තවදුරටත් එකී පාසල් පුරප්පාඩු පවතින බවත්ය.

පැමිණිලිකරුගේ අම්/කාවන්තිස්ස විද්‍යාලයේ සිට නැවත මාරු කිරීම සම්බන්ධයෙන් ලැබුණු පැමිණිල්ල (පැමිණිලි අංක HRC/AM/150/15) 2016.02.01 විභාගයට ගන්නා ලද අතර එහිදී පාර්ශවයන් එකඟතාවයකට පැමිණියේ විශේෂයෙන්ම <u>අම්/කාවන්තිස්ස විද්‍යාලයේ පුරප්පාඩු නොමැතිකම හා පැමිණිලිකරු දුෂ්කර සේවයක් කර නොතිබීම</u> යන කරුණු පදනම් කරගෙනය. ඒ අනුව දීඝවාපිය මහ විද්‍යාලය වෙත ස්ථාන මාරු කිරීමට එකඟත්වය පළ කර ඇත.

එකී පැමිණිල්ල නැවත සක්‍රීය කිරීමට සිදුවන්නේ පැමිණිලිකරු විසින් 2016.06.15 වන දින නැවත කරන ලද පැමිණිල්ල අනුවය. එකී පැමිණිල්ලෙන් මූලිකව විරෝධය දැක්වනුයේ අම්/කාවන්තිස්ස විද්‍යාලයේ ඉංග්‍රසි විෂයන් සඳහා එස්.එම්.ඩී.ජී සකලසූරිය ගුරුවරිය ස්ථානමාරු කිරීමෙන් පසුවය. වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, එකී ගුරුවරිය අම්/කාවන්තිස්ස විද්‍යාලය වෙත ස්ථානගත කරන ලද්දේ පුරප්පාඩු සලකා නොව පෞද්ගලිකව ඇයගේ ගර්භනීභාවය සලකා බවයි. එහෙත් පැමිණිලිකරු 2016.10.19 වන දින පරීක්ෂණයේදී අනාවරණය කර ඇත්තේ එය ස්ථානගත කිරීමක් නොව ස්ථානමාරු කිරීමක් බවත්, තමන්ට ලබාදී තිබූ ඉංග්‍රීසි කාල සටහනම ඇයට ලබා දී ඇති බවත්ය. එමෙන්ම ඇයගේ ගර්භනීභාවය මත මානුෂික හේතූන් මත මාරු කළේ නම් ඇයගේ නිවසට ආසන්න දමන ප්‍රදේශයේ පාසලකට හෝ මීටර් 300 ක් පමණ දුරින් පිහිටි සීවලි විද්‍යාලයට ඇයව පත්කළ හැකි බවත්ය. .

තත්වය මෙසේ තිබියදී අම්/කාවන්තිස්ස විද්‍යාලය වෙත තවත් ආර්.පී.එල්.වී රාජපක්ෂ යන ඉංග්‍රීසි ගුරුවරයා ස්ථානමාරු කර ඇති අතර එකී ස්ථානමාරුව ලබා දීම සාධාරණීකරණය කිරීම සඳහා වගඋත්තර පාර්ශවීය අම්පාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ 2016.02.07 වන දින කරුණු දක්වමින් 2017 වර්ෂය සඳහා අම්/කාවන්තිස්ස විද්‍යාලයේ 10 හා 03 ශ්‍රේණිවල පමණක් පන්ති එක බැගින් වැඩි වූ බවත්, 06 ශ්‍රේණිය සඳහා ද්වීභාෂා පන්තියක් ආරම්භ කර ඇති බවත්, එමෙන්ම නව ඉංග්‍රීසි පත්වීම්ලාභීන්ගේ ගුරුවරයෙකු අම්/හැගොඩ ඉන්ද්‍රසාර විද්‍යාලයට පැමිණි බවත්, ඒ අනුව එහි සිටි ඉංග්‍රීසි ගුරුවරයා අතිරික්ත ලෙස හඳුනගෙන ඔහු අම්/කාවන්තිස්ස විද්‍යාලයට ස්ථාන මාරු කළ

බවත්. එමෙන්ම අමතර පන්ති වැඩිවීම හා ද්වීභාෂා හා ඉංග්‍රීසි ගුරුවරියන් ප්‍රසූත නිවාඩු ලබාගත් නිසා කාලච්ඡේද වැඩිවීම ඒ සඳහා හේතු වූ බවත්ය.

එහෙත් ප්‍රායෝගිකව 10 පන්තිය හා 3 ශ්‍රේණිවල සමාන්තර පන්ති වැඩිවීමක් සිදුවන්නේ 1 වසර 6 වසර හෝ 12 වසර වීම සාමාන්‍ය තත්වයකි. ඒ අනුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පදනම් විරහිත කරුණු ඉදිරිපත් කර ඇති බව අනාවරණය වේ. එමෙන්ම ඉංග්‍රීසි ගුරුවරිය ප්‍රසූත නිවාඩු ලබාගැනීම නිසා කාලච්ඡේද ආවරණය කිරීම ගැටළු සහගත බවද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ පිළිගන්නා බව අනාවරණය වේ. මීට පෙර 2003/38 චක්‍රලේඛය අනුව අනුමත ඉංග්‍රීසි ගුරු කාඩරය අනුව පුරප්පාඩු නොමැති බව ප්‍රකාශ කළ අතර 12/2015 හා 01/2016 අනුවද පුරප්පාඩු නොමැති බව පිළිගත් වගඋත්තර පාර්ශවය 2017 වසරේ පාසල තුළ පුරප්පාඩු නිර්මාණය කර ඇති බව අනාවරණය වේ.

2016.06.23 වන දින වගඋත්තර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කළ වාර්තාව අනුව අම්පාර කලාපයේ ඉංග්‍රීසි ගුරුවරු 130 ක ඌණතාවයක් පවතින බවට අවධාරණය කර ඇති අතර 2016.07.29 වන දින වාර්තාව අනුව අම්පාර කලාපයේ ඉංග්‍රීසි ගුරුවරු 120 ක් පමණ ඌණතාවයක් ඇති බවට අවධාරණය කර ඇත. ඒ අනුව 2016.06.23 සිට 2016.07.29 මාසයක කාලය තුළ ඉංග්‍රීසි ගුරු ඌණතාවය 130 සිට 120 දක්වා අඩු වී ඇති බවද දක්වා ඇත.

කෙසේ නමුත් මේ තරම් ඌණතාවයක් තිබියදී වගඋත්තර කලාප අධ්‍යක්ෂවරයා විසින් අම්/හැගොඩ ඉන්ද්‍රසාර විද්‍යාලයට නව ඉංග්‍රීසි ගුරුවරයෙකු ලැබීමෙන් පසුව හිටපු ඉංග්‍රීසි ගුරුවරයා අතිරික්ත බව හඳුනාගෙන ඔහු මෙතෙක් පුරප්පාඩු නොමැති බවට විවිධ ආකාරයෙන් සනාථ කළ අම්/කාවන්තිස්ස විද්‍යාලයට ස්ථාන මාරුකර ඇති බව නිරීක්ෂණය වේ. එමෙන්ම වෙනත් පාසල්වල ඉංග්‍රීසි ගුරුවරු 120 ක ඌණතාවයක් තිබියදීත් එසේ ඉංග්‍රීසි ගුරුවරයෙකු පත්කිරීමෙන් අනෙක් පාසල් නොසලකා හැර ඇති බවද අනාවරණය වේ. ඒ අනුව වගඋත්තර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඉංග්‍රීසි ගුරුවරුන් ගුරු හිඟ පාසල් වලට යොමු නොකිරීම තුළින් එම පාසල් සඳහා අසාධාරණයක් සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

එමෙන්ම මීට පෙර පැමිණිලිකරු අම්/කාවන්තිස්ස විද්‍යාලයට වෛද්‍ය හේතූන් මත ස්ථානමාරු කිරීමට එරෙහිව ක්‍රියාත්මක වූ ගුරු සංගම් නියෝජිතයින් ඉන් පසුව අම්/කාවන්තිස්ස විද්‍යාලය වෙත කරන ලද ස්ථාන මාරු කිරීම හෝ ස්ථානගත කිරීම සඳහා කිසිදු විරෝධතාවයක් දක්වා නොමැති බවද අනාවරණය වේ.

එසේම පැමිණිලිකරු අම්/කාවන්තිස්ස විද්‍යාලය වෙත ස්ථානමාරු කර ඇත්තේ වගඋත්තර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ වාචික නිර්දේශ මත බව අධ්‍යාපන ලේකම් පිළිගෙන ඇත. එම අවස්ථාව වනවිට අම්පාර නගරයේ අම්/බණ්ඩාරනායක බාලිකා විද්‍යාලයේද පුරප්පාඩු පවතින බව එහි විදුහල්පතිනිය වාර්තා කර ඇති බවද නිරීක්ෂණය වේ.

මෙකී සමස්ථ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී අම්/කාවන්තිස්ස විද්‍යාලයේ පුරප්පාඩු පවතිද්දී පැමිණිලිකරුට එම විද්‍යාලයේ සේවය කිරීමට ඉඩ ලබා නොදී ඔහු වෙනත් පාසලකට පත්කර යැවීමෙන් වගඋත්තරකාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පැමිණිලිකරු සම්බන්ධයෙන් අත්තනෝමතික ආකාරයෙන් කටයුතු කර ඇති බවද නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඒ අනුව පුරප්පාඩු පවතින අම්/කාවන්තිස්ස විද්‍යාලයට පැමිණිලිකරුට ලබාදුන් ස්ථාන මාරුව බලරහිත කර වෙනත් පාසලකට ස්ථාන මාරු කිරීමෙන් හා එම පාසලේ පැවැති ගුරු පුරප්පාඩු සම්බන්ධයෙන් විවිධ හේතුන් ඉදිරිපත් කරමින් වෙනත් ඉංග්‍රීසි ගුරුවරුන් පත් කිරීම හේතුවෙන් පැමිණිලිකරු වෙනස්කමකට භාජනය කරමින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) 12(2) ව්‍යවස්ථාවන් මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් අම්පාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සිය බලය අයුතු ලෙස යොදවා ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

ඒ අනුව පැමිණිලිකරු වෙත අම්/කොක්නහර මහා විද්‍යාලයට ලබා දී ඇති ස්ථාන මාරුව අවලංගු කර නැවත අම්/කාවන්තිස්ස විද්‍යාලයට ස්ථාන මාරුවක් ලබා දීමට පියවර ගත යුතුය.

2019.02 - ට වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත් :- 1. ගුරු අමාත්‍යතුමා.
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල. B/